දිස්ත්‍රික් ලේකම්
மாவட்ட செயலாளர்
District Secretary
055 2276235
055 4936439

ෆැක්ස්
தொலை நகல்
Fax
055 2276025
055 2276067

විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் /e-mail : ds@moneragala.dist.gov.lk
mondistsec@gmail.com
වෙබ් අඩවිය / வலைத்தளம் / Web : www.monaragala.dist.gov.lk

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල දිස්ත්‍රික්කය
# மாவட்ட செயலகம் – மொனராகலை மாவட்டம்
# DISTRICT SECRETARIAT – MONERAGALA DISTRICT

මගේ අංකය / எனது இல / My No. MO/DS/ACC/12/09/2026

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2026.09.

කළමනාකරු,

……………………………………………………………………………

**<u>ප්‍රජා ශක්ති දිළිඳුබව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා මොනරාගල දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයේ ප්‍රජා ශක්ති ඒකක සඳහා පරිඝණක යන්ත්‍ර මුද්‍රණ යන්ත්‍ර හා පරිඝණක බැටරි මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීම - 2026</u>**

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල</u>**

**<u>මිල කැඳවීම සම්බන්ධ පොදු කොන්දේසි</u>**

01. මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ප්‍රජා ශක්ති දිළිඳුබව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය යටතේ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයේ ප්‍රජා ශක්ති ඒකක සඳහා පරිඝණක යන්ත්‍ර 24ක් මුද්‍රණ යන්ත්‍ර 12ක් හා පරිඝණක බැටරි 24 ක් සැපයීම, ප්‍රවාහනය කිරීම, ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.(මෙහි සඳහන් යන්ත්‍ර ගණන පවතින ප්‍රතිපාදන ප්‍රමාණය මත වෙනස්විය හැක)

| තාක්ෂණික උපකරණය | අවශ්‍ය ගණන | ලංසු සුරක්ෂණ වටිනාකම |
|---|---|---|
| ඩෙස්ක්ටොප් පරිගණක | 24 | 60,000.00 |
| කළු සුදු මුද්‍රණ යන්ත්‍ර | 12 | |
| පරිගණක බැටරි | 24 | |

02. ඉහත මිලදී ගැනීමට අපේක්ෂිත යන්ත්‍ර වලට අදාල **ලංසු ලේඛන (Bidding Documents)** **<u>www.monaragala.dist.gov.lk</u>** යන වෙබ් අඩවියෙහි පලකර ඇති අතර එම **ලංසු ලේඛනයන්හි ඇතුලත්** පිරිවිතරයන්ට හා තොරතුරු වලට අනුකූලව පමණක් ලංසුපත් ඉදිරිපත් කලයුතු බව දන්වමි. තවද නිෂ්පාදකයාගේ නියම තත්වයේ යන්ත්‍ර (Original Product) පමණක් මිලදී ගැනීමට අපේක්ෂා කරන අතර ඒ බව තහවුරු කරන ලිපි මිල ගණන් ඉදිරිපත් කිරීමේදී අමුණා එවිය යුතුය.

03.ලංසු ඉදිරිපත් කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවේ සුරක්ෂිත භාවය සනාථ කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර ඉහත සඳහන් වටිනාකම්වලට සමාන දින 77 ක (2026.10.07 සිට 2027.12.24 දක්වා) වලංගු කාලයක් සහිත ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත් වාණිජ බැංකුවකින් "දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල" වෙත නිකුත් කරන ලද ලංසු ඇපකරයක් ලංසු පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු වන අතර එලෙස ලංසු ඇපකරයක් (Bid Security) ඉදිරිපත් නොකරන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.බැංකු ඇපකරයක් වෙනුවට එම වටිනාකම මොනරාගල දිස්ත්‍රික් ලේකම් වෙත මුදලින්ද තැන්පත් කළ හැකිය.



අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மாவட்ட செயலாளர் / Additional District Secretary 055 4936441

සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary 055 4936442

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant 055 4936443

පරිපාලන නිලධාරී / நிருவாக அலுவலர் / Administrative Officer 055 4936452

කාර්යාලය / செயலகம் / Office 055 2276230 055 2276234

04.මුද්‍රා තබන ලද ලංසුපත් 2026.10.07 දින ප.ව 2.30 ට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල යන ලිපිනයට එවීමෙන් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙහි තබා ඇති ලංසු පෙට්ටියෙහි තැන්පත් කිරීමෙන් ඉදිරිපත් කළ හැක. 2026.10.07 වෙනි දින ප.ව 2.30 ට පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒවා විවෘත නොකර අයදුම්කරුවන් වෙත ආපසු භාර දෙනු ලැබේ.

05.අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලංසු, විවෘත කරන දින සිට දින හතලිස් නවයක (49) කාලයකට වලංගු විය යුතුය.

06.තෝරාගනු ලැබූ ආයතනයට ලංසුව පිළිගත් බව දන්වන ලිපියක් ඔහු විසින් ලංසු පත්‍රයේ සඳහන් කරනු ලබන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ.

07.මෙම යන්ත්‍ර මිලදී ගැනීමට තෝරා ගන්නා ආයතනය මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් සමඟ ලිඛිත ගිවිසුමකට එළඹිය යුතුය. ඇණවුම ලබා දී ගිවිසුම්ගත වූ දින සිට දින14 ක් ඇතුළත යන්ත්‍ර සපයා අවසන් කළ යුතුය.

08. ඔබගේ මිල ගණන් සමඟ පහත සඳහන් ලියකියවිලි වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතුය. අවශ්‍ය විටකදී එම ලියකියවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කලයුතුය.
I. සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය.
II. බදු වලට අදාල ලියාපදිංචි කරන ලද සහතික
III. මෙම යන්ත්‍ර සැපයීම පිළිබඳව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ සහතික (පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ප්‍රසම්පාදන අයදුම්පතට ඇමිණිය යුතුය.)
IV. මුල්‍ය තත්වය සනාථ කිරීම සඳහා ආසන්න පසුගිය වර්ෂ 03ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.
V. මෙම යන්ත්‍ර පිළිබඳව ලබාගෙන ඇති ප්‍රමිතිකරන සහතිකවල (ISO or Equivalent) පිටපත් අමුණා එවිය යුතුය.

09.තෝරාගනු ලැබූ ආයතනය ගිවිසුම් අත්සන් කිරිම සඳහා ප්‍රසම්පාදන මුදලින් 10%ක මුදලකට සරිලන කාර්යසාධන ඇපකරයන් (Performance bond) ඉදිරිපත් කළ යුතුය.

10.සම්පූර්ණ කරනු ලබන ලංසු පත් පිටපත් දෙකකින් යුතුව පිළියෙල කර එහි මුල්පිටපත හා අනුපිටපත යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා, එම ලිපි කවරෙහි ඉහළ වම් කෙළවරෙහි "ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය ඩෙස්ක්ටොප් පරිගණක මුද්‍රණ යන්ත්‍ර හා පරිසනක බැටරි සඳහා මිල ගණන්" ලෙස සඳහන් කර මුද්‍රා තබා "සභාපති, ප්‍රසම්පාදන කමිටුව,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල" යන ලිපිනයට 2026.10.07 දින ප .ව. 2.30ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දෙවන මහලේ පිහිටි ගණකාධිකාරි කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීමට පුළුවන. එමෙන්ම අනු පිටපත, මුල්පිටපතේ සෑම පිටුවකම සහතික කරන ලද ඡායාස්ථ පිටපතක් විය යුතුය. විකල්ප ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.මිල ගණන් විවෘත කිරීම එදින ප.ව 02.30 ට ලංසුපත් භාර ගැනීම අවසන් කල වහාම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දෙවන මහලේ පිහිටි ප්‍රධාන ගණකාධිකාරි නිල කාමරයේදී සිදු කෙරේ. මිල ගණන් විවෘත කරන අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

11.ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් දුරකථන අංක 055 2276067 මඟින් ගිණුම් අංශය අමතීමෙන් ලබාගත හැක.

ජේ.එම්.පී.සිරිවර්ධන,
ප්‍රධාන ගණකාධිකාරී,
මොනරාගල දිස්ත්‍රික් ලේකම් වෙනුවට.